ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
ඇබෑර්තු

# මාධ්‍ය නිලධාරී (දෙමළ)

පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුර සඳහා මනා සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ට චරිතයකින් යුතු ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල කරගත් අයදුම්පත්, අධ්‍යාපන/ වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත්ද සමඟ **2025** ඔක්තෝබර් මස **31** දින හෝ ඊට පෙර ලැබෙන සේ **"පාර්ලිමේන්තුවේ මහ ලේකම්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. තමන් අයදුම්කරන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කළ යුතුය. (මෙම දැන්වීම www.parliament.lk වෙබ් අඩවිය ඔස්සේද ලබා ගත හැකිය)

**මාධ්‍ය නිලධාරී (දෙමළ) තනතුර - ( මුළු පුරප්පාඩු සංඛ්‍යාව - 01)**

1. **රැකියා විස්තරය -** මාධ්‍ය අංශයට පැවරී ඇති රාජකාරි ඉටු කිරීම සඳහා කළමනාකාරිත්වයට සහාය වීම

2. **වැටුප් පරිමාණය -** 2025.03.25 දිනැති අංක 04/2025 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු. 58,660-9x1190/3x1360 – 73,450 වේ. (සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු.100,000/- පමණ වේ).

3. **වයස් සීමාව -** අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 21ට නොඅඩු සහ අවුරුදු 35ට නොවැඩි විය යුතු ය.

4. **අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුද්ද -**
   විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද විශ්ව විද්‍යාලයක් වෙතින් ලබා ගත් දෘශ්‍ය කලා (විශේෂ) උපාධිය (බහු මාධ්‍ය කලා) / (දෘශ්‍ය සන්නිවේදන සැලසුම් කලා)

   හෝ

   විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද විශ්ව විද්‍යාලයක් වෙතින් ලබා ගත් ශාස්ත්‍රවේදී උපාධිය (සන්නිවේදනය/ ජනසන්නිවේදනය/ ජනමාධ්‍ය/ මහජන සම්බන්ධතා හා මාධ්‍ය කළමනාකරණය/ සන්නිවේදනය හා නිර්මාණාත්මක කලා/ සමාජ විද්‍යාව/ දේශපාලන විද්‍යාව විෂයයක් වශයෙන්)

   හෝ

   විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද විශ්ව විද්‍යාලයක් වෙතින් ලබා ගත් ජනමාධ්‍යවේදය උපාධිය

   සමඟ

   ජනමාධ්‍යවේදය හෝ ජනසන්නිවේදනය යන ක්ෂේත්‍රවල වසර තුනකට නොඅඩු පළපුරුද්ද

5. **බඳවා ගැනීමේ ක්‍රමය -** ලිඛිත පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

සම්මුඛ පරීක්ෂණයේදී, පාර්ලිමේන්තුවේ මහ ලේකම් විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පහත සඳහන් නිර්ණායක අනුව ලකුණු ලබා දෙනු ලැබේ.

| අනු අංකය | විෂයය ක්ෂේත්‍රය |
|---|---|
| 1 | අමතර අධ්‍යාපන සුදුසුකම් |
| 2 | භාෂාව සහ සන්නිවේදන කුසලතා |
| 3 | පරිගනක සාක්ෂරතාව |
| 4 | සේවා පළපුරුද්ද සහ ක්ෂේත්‍ර දැනුම |
| 5 | පෞරුෂත්වය හා සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතා |

**6. සේවා නියමයන් හා කොන්දේසි:-**

(i) මෙම තනතුර ස්ථිරය. මෙම තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට අයදුම්කරුවන් යටත් විය යුතුය. තෝරා ගනු ලබන අයදුම්කරුවන් මූලිකව වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබන අතර, රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ තනතුරක සේවය ස්ථිර කරනු ලැබූ පුද්ගලයෙකු තෝරා ගනු ලැබුවහොත් ඔහු/ ඇය වසරක වැඩ බැලීමේ කාලයකට යටත්ව පත් කරනු ඇත.

(ii) තෝරා ගනු ලබන අයදුම්කරුවන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයට අදාළ වන මූල්‍ය හා දෙපාර්තමේන්තු රෙගුලාසිවලට යටත් වනු ඇත.

(iii) තෝරා ගනු ලබන අයදුම්කරුවන්, රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයකට අනුව වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට තම වැටුපෙන් දායක මුදල් ගෙවිය යුතුය.

(iv) තෝරා ගනු ලබන අයදුම්කරුවන් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය විය යුතුය.

(v) තෝරා ගනු ලබන අයදුම්කරුවන් පත් කරනු ලැබීමට පෙර ඔවුන් පිළිබඳව ආරක්ෂක නිශ්කාෂණ තොරතුරු වාර්තා ලබා ගනු ඇත.

**7.** අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් පිටපත් නොවේ) සිය අයදුම්පත්වලට අමුණා එවිය යුතු අතර, ඉල්ලා සිටින විටෙක මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.

(අ) උප්පැන්න සහතිකය
(ආ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කෙරෙන සහතික
(ඇ) වෘත්තීයමය සුදුසුකම් සනාථ කෙරෙන සහතික
(ඈ) පළපුරුද්ද සනාථ කෙරෙන සහතික

**8.** රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ සේවය කරන අයදුම්කරුවන් සිය අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා හරහා එවිය යුතුය.

**9.** තනතුරු ලබා ගැනීමේ අරමුණින් කවර හෝ ආකාරයකින් බලපෑම් කිරීම තනතුර සඳහා නුසුදුසුකමක් වනු ඇත.

**10.** අයදුම්පත්‍රයෙහි සඳහන් වන කවර කරුණක් හෝ සාවද්‍ය යැයි යමකු තෝරා ගැනීමට පෙර සොයා ගනු ලැබුවහොත්, ඔහු/ ඇය නුසුදුස්සකු බවට නම් කරනු ලැබීමට ද, පත් කිරීමෙන් පසු එසේ අනාවරණය වුවහොත්, සේවයෙන් පහ කරනු ලැබීමට ද හේතු වනු ඇත.

**11.** අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව එවනු ලබන හෝ, ඉහත සඳහන් කළ අධ්‍යාපන සහතිකවල සහ සේවා සහතිකවල පිටපත් රහිතව එවනු ලබන හෝ, දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියා හරහා එවනු නොලබන (දැනට රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ සේවය කරනු ලබන්නේ නම්) අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියා හරහා යොමු කරනු ලැබුවද, අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව එවනු ලබන සහ ආදර්ශ අයදුම්පත්‍රය ප්‍රකාරව පිළියෙල නොකරන ලද අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

වැ.බ. පාර්ලිමේන්තුවේ මහ ලේකම්

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ
2025 ඔක්තෝබර් මස .......... වැනි දින.